# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 2171635<br>10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1276 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 05/08/2024<br>පැය 0715 |

## මාධ්‍ය නිවේදනය

**01. ගිනි ගැනීමක් හේතුවෙන් දස සිල් මාතාවක් මියයාම - රස්නායකපුර පොලිස් වසම.**

2024.08.04 වන දින රාත්‍රී කාලයේ රස්නායකපුර පොලිස් වසමේ අඹගම්මන ප්‍රදේශයේ පිහිටි ආරාමයක වැඩි විසූ දස සිල් මාතාවක් එම ආරාමයේ කාමරයක ඇතිවූ ගින්නක් හේතුවෙන් පිළිස්සී මියගොස් ඇති ලද පණිවිඩයක් මත රස්නායකපුර පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 70 ක් වන ඉහත ආරාමයේ වැඩ වාසය කරනු ලැබූ දස සිල් මාතාවකි.**

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කිරීමට නියමිතව ඇත. ගින්න ඇතිවූ ආකාරය සම්බන්ධයෙන් මෙතෙක් අනාවරණය වී නොමැත. රස්නායකපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**02. වන අලි ප්‍රහාරයකින් පුද්ගලයෙකු මියයාම - නොච්චියාගම පොලිස් වසම.**

2024.08.04 වන දින උදෑසන කාලයේ නොච්චියාගම පොලිස් වසමේ ඇහැටුවාගම ප්‍රදේශයේ වන අලි ප්‍රහාරයකින් පුද්ගලයෙකු තුවාල ලබා නොච්චියාගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට නොච්චියාගම පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වන අඹගහවැව, නොච්චියාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සම්බන්ධ පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකර ඥාතීන්ට භාරදී ඇත. මරණකරු වගාව වන සතුන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා ගොස් නැවත නිවස වෙත පැමිණෙමින් සිටියදී මෙම අනතුරට ලක්ව ඇති බවට අනාවරණය වී ඇත. නොච්චියාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - මොරවැව පොලිස් ස්ථානය.**

2024.08.04 වන දින සවස් කාලයේ දී මොරවැව පොලිස් වසමේ පන්මැදවච්චිය ප්‍රදේශයේ දී මොරවැව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන මොරවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**